# සංස්කෘතියක් තවත් සංස්කෘතියකින් අවශෝෂණය කිරීම

වැවක් පමණක් නොව වෙනත් ඕනෑම දෙයක් වුව ද නිර්මාණය කිරීමේ දී සංස්කෘතියක් හා චින්තනයක් අවශ්‍ය බැව් අපි කීවෙමු. ඒ වෙනත් ඕනෑම දෙය භෞතික විද්‍යාව, රසායනය, ගණිතය හෝ වෙනත් දැනුමක් විය හැකි ය. විදුසර පුවත්පත සාමාන්‍ය සමාජ සම්මුතියෙහි නම් ප්‍රධාන වශයෙන් බටහිර ස්වාභාවික විද්‍යාවන්ට හා දෙවනුව ඒ ආශ්‍රිත ඉංජිනේරු විද්‍යාව හා බටහිර වෛද්‍ය විද්‍යාව වැනි තාක්ෂණයන්ට වෙන් වූවකි. එහෙත් අපි මේ ලිපි පෙළෙහි ඉතිහාසය හා වෙනත් විෂය ද සාකච්ඡා කරමු. ඇතැමුන්ට ඒ ප්‍රශ්නයක් වීමට හැකි ය.

දැනට අවුරුදු විසි දෙකකට පමණ පෙර අප අපේ දැනුමක් ගැන කතාකිරීම අරඹා ටික කලකට පසු ජාතිකත්වය තම දේශපාලන බල ව්‍යාපෘතියෙහි කිහිලි කරුවක් කරගත් ඇතැම්හු ඉන්දියන් ගණිතඥයන් හා (බටහිර) බිද්‍යාඥයන් පැරණි භාරතීය ගණිතය හා භාරතීය විද්‍යාවන් ගැන සොයා බලා ඒ හෙළිකරගනිද්දී අප සිංහල ගණිතයක් ගැන කතාකරමින් පමණක් සිටින්නේ යැයි දේෂාරෝපණය කළහ. අද හෙට බැරි නම් තව අවුරුදු පහකින් හොඳින් හෝ නරකින් හෝ බලයට පැමිණීමට කැස කවන මේ දේශපාලන අවස්ථාවාදීහු අනෙක් පක්ෂ හා සංවිධාන ඔස්සේ ඔවුන්ගේ සංවිධාන ගොඩනගා ගනිමින් බලයට පැමිණීමට අපේක්ෂා කරති.

මොවුහු කිසි දිනෙක අප කරන්නේ කුමක් දැයි අවබෝධ කරගැනීමට උත්සාහ නො දැරූහ. අපට අවශ්‍ය වන්නේ හුදෙක් පැරණි සිංහල ගණිතය හෝ පැරණි සිංහල භෞතික විද්‍යාව හෝ දැනගැනීම නොව එයට පදනම් වූ චින්තනය හා සංස්කෘතිය කුමක් දැයි දැනගැනීම ය. අපි දැන් බොහෝ දුරට ඒ දනිමු. ආරම්භයේ සිට ම අපේ අරමුණ කුමක් ද යන්න පිළිබඳ ව අපට සැකයක් නො තිබුණි. අපි කිසිම දේශපාලන පක්ෂයක සාමාජිකත්වයක් ලබාගෙන නො සිටින්නෙමු. අපේ ව්‍යාපෘතිය පක්ෂ දේශපාලනයෙන් ස්වාධීන වෙයි.

භාරතයේ පැරණි දැනුම් ගැන කතාකල පිරිස් අද විසිරී ගොස් ය. භාරතයෙහි පැරණි දැනුම ගැන සෙවූවන්ට චින්තනයක් දැනගැනීමට අවශ්‍ය නො වීය. ඔවුහු ඒ සංකල්පය නො දනිති. එහෙත් අපි අපේ වෑයමෙහි ම නිරත වී සිටිමු. අප අපේ චින්තනය කුමක් දැයි යම් ප්‍රමාණයකට දනිමු. එහෙත් අප තවත් ඒ අධ්‍යයනය කළ යුතු ය. අපට ඉතිහාසය අඩු තරමින් කරුණු දෙකක් නිසා වැදගත් වෙයි. පළමුව අපේ පැරණි චින්තනය කුමක් දැයි ඒ ඔස්සේ දැනගත හැකි ය. දෙවනුව අපේ චින්තන රටාවන් අනුව ඉතිහාසය විද්‍යාවන්ගෙන් වෙන් කළ හැකි නො වෙයි. එබැවින් විද්‍යාවන් ගැන හැදෑරීම යනු ඉංගිරිසි පොතක සඟරාවක ඇති දෙයක් අධ්‍යයනය කිරීම පමණක් නො වෙයි. එසේත් නැතහොත් භෞතිකය, රසායනය ආදී වශයෙන් බටහිරයන් විසින් වර්ගීකර වෙන්කර ඇති විෂයයක් වෙන ම හැදෑරීම නො වෙයි. අපි එහි දී සාමාන්‍යයෙන් විද්‍යාවට සම්බන්ධ නැතැයි සිතන විෂය ක්ෂෙත්‍ර ද හදාරමු.

ඒ කෙසේ වෙතත් වැව යන්න ඇතුළත් වන්නේ තාක්ෂණයට ය. වැවේ නිර්මාණය තාක්ෂණයට අයත් නොවන්නේ නම් ඒ අයත්වන්නේ කුමකට ද? අප වැව ගැන කතාකරන්නේ ඒ ඒ අවස්ථාවෙහි අපේ ලිපි පෙළට එහි ඇති වැදගත්කම සැලකිල්ලට ගනිමින් ය. එසේ නැතිව වැවක් ගැන කෙරෙන හුදු අධ්‍යයනයක් ද මෙයින් පිලිබිඹු නො වෙයි. වැව අපට මේ අවස්ථාවෙහි දී වැදගත්වන්නේ යක්ෂ ගෝත්‍රිකයන්ට ඒ නිර්මාණය කිරීමට තුඩු දුන් කරුණු සලකා බැලීමේ දී ය. ඒ සන්දර්භයෙහි දී වැව් වර්ගීකරණය හෝ වැවෙන් සිංහලයන් ලබාගත් ප්‍රයෝජන හෝ සාකච්ඡා නො කෙරෙයි.

යක්ෂ ගෝත්‍රිකයන් වෙනත් රටක දී විශේෂයෙන් ම භාරතයෙහි දී වැව් නිර්මාණය නොකරන්නටත් ලංකාවේ දී එසේ කරන්නටත් හේතුව කුමක් ද? අනෙක් අතට ලංකාවේ වෙනත් ගෝත්‍රයකට වැව් නිර්මාණය කිරීමට නොහැකි වූයේ ඇයි ද යන්නත් සැලකිල්ලට ගත යුතු ය. මේ ප්‍රශ්නවලට පිළිතුරු දීමේ දී අපි ඉතිහාසය පිළිබඳ යම් යම් කරුණු අනාවරණය කර ගැනීමට ද උත්සාහ දරමු. එමගින් ඉතිහාසය හැදෑරීම සඳහා ද සම්මත ක්‍රමවලින් බැහැර වූ ක්‍රමවේදයක් හඳුන්වා දෙමු.

වැවක් මුලින් ම තැනීමට කලින් සඳහන් කර ඇති ආකාරයට තාක්ෂණයත් චින්තනය හා සංස්කෘතියත් අවශ්‍ය වෙයි. යම් සංස්කෘතියක වැවක් නිර්මාණය කිරීමෙන් පසුව වෙනත් සංස්කෘතියක ඒ අනුකරණය කරමින් වැව් තැනීම

© Prof. Nalin De Silva

එතරම් අමාරු කාර්යයක් නො වෙයි. අද අපි බටහිර විද්‍යාව මෙරට නිර්මාණය නො කරමු. එහෙත් බටහිර විද්‍යාව ඉගෙන ගැනීම අපට අසීරු කාරණයක් නො වෙයි. අප බටහිර විද්‍යාව ඉගෙන ගන්නේ හුදු අනුකාරකයන් ලෙස ය.

යක්ෂ ගෝත්‍රිකයන් අතින් භාරතයේ දී වැව් නිර්මාණය නොකෙරී ලංකාවේ දී  නිර්මාණය කෙරෙන්නට හේතුවන්නට ඇත්තේ ඒ ගෝතිකයන්ට වැව් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණය තිබුණ ද, භාරතයේ නොතිබ් චින්තනයක් හා සංස්කෘතියක් ලංකාවේ තිබීම නිසා යැයි උපකල්පනය කිරීම, ඇත්තට ම උද්ගමනය කිරීම (induction), යුක්ති යුක්ත ය. එපමණක් නො වෙයි. යක්ෂ ගෝත්‍රිකයන්ට ඒ සඳහා අවශ්‍ය තාක්ෂණය තිබුණ ද, ඔවුන් මුලින් ජීවත් වූ දේශයේ ද, ඒ පර්සියාව හෝ එයට ආසන්නයෙන් බටහිරින් වූ දේශයක් හෝ වේවා, වැව් නිර්මාණය සඳහා අවශ්‍ය සංස්කෘතිය හා චින්තනය නොතිබෙන්නට ඇත.

අනෙක් අතට මෙරට විසූ ගෝත්‍රිකයන්ට වැව් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය චින්තනය තිබුණ ද, ඒ සඳහා අවශ්‍ය තාක්ෂණය යක්ෂ ගෝත්‍රිකයන් මෙහි පැමිණෙන තෙක් නොතිබුණු බැව් පැහැදිළි ය. එසේ නොවන්නට මෙරට විසූ පැරණි ගෝතිකයන් වැව් නිර්මාණය කිරීමට තිබුණි. මේ කරුණු අප කලින් සඳහන් කර ඇති පස් මහ බැලුම් සමග සංසන්දනය කිරීම වැදගත් වෙයි. බෝසතාණන් වහන්සේ පස් මහ බැලුම් බලා දඹදිව ශාක්‍ය වංශයෙහි නොඉපදී වෙනත් රටක ඉපදුනේ නම් පාරමිතා පුරා තිබුණ ද, බුදුවීමට නොහැකිවීමට තිබුණි.

අප ඉතිහාසය  දකින ආකාරයට සිදුහත් කුමරුට බුදුවීම සඳහා අවශ්‍ය චින්තනය තිබුණේ එකල දඹදිව නැගෙනහිර හා ඊසාන ප්‍රාන්තවල ය. ඒ වන විට ආර්ය සංස්කෘතිය දඹදිව බටහිර ප්‍රදේශවල මෙන්  තදින් නැගෙනහිර හා ඊසාන ප්‍රදේශවල පැතිරී නො තිබුණි. එබැවින් දඹදිව හා සාධාරණ වශයෙන් ගත්කල අපේ කලාපයේ පැරණි සංස්කෘතිය හා චින්තනය යම් ප්‍රමාණයකට දඹදිව නැගෙනහිර හා ඊසාන ප්‍රදේශවල ඒ වන විටත් නොනැසී තිබුණි. අනෙක් අතට සමාජයේ යම් යම් වෙනස්කම් ඇති වෙමින් තිබුණි. උදාහරණයක් වශයෙන් පැරණි ගෝත්‍රික ජනසංඝ රාජ්‍යයෙන් ඒක පුද්ගල රජවරුන්ගේ රාජ්‍යයට සමාජය විකාශය වෙමින් තිබුණි. වෙනස්වීම හා අනිත්‍ය, වෙනස් වීම ඉතා දීර්ඝකාලීන ව සිදුවන සමාජයකට වඩා එවැනි ඉක්මනින් වෙනස්වන සමාජයක තේරුම් ගැනීම පහසු වෙයි.

ලිච්ඡවි රජදරුවන් අතර පැවතියේ පැරණි ජනසංඝ රාජ්‍යයකි. ගෞතම ගෝත්‍රිකයෝ ඒ තත්වයෙන් වෙනස් වී කුඩා රාජ්‍ය පිහිටුවීමේ මාර්ගයට පිවිස සිටියහ. ශාක්‍ය වංශය හා කෝලිය වංශය එසේ ජනසංඝයෙන් කැඩී වෙනම කුඩා රාජ්‍ය පිහිටුවාගෙන තිබුණි. ඔවුන්ගේ කුඩා රාජධානි කිඹුල්වත් නුවර හා දෙව්දහ නුවර පිහිටියේ ය. මේ නගර දෙක අතර එතරම් දුරක් නොවූ බව පැහැදිළි ය. මහාමායා දේවිය සිදුහත් කුමරුගේ උත්පත්තිය සඳහා කිඹුල්වත් නුවර සිට දෙව්දහ නුවරට යෑමට උත්පත්තියට ඉතා ආසන්න කාලයක දී පිටත්විමෙන්  පෙන්නුම් කරන්නේ ඒ නගර එකිනෙක සමීපයේ පිහිටි බව ය.

එමෙන් ම දෙව්දත් කුමරු හා සිදුහත් කුමරු එකට සෙල්ලම් කළ බව ද සඳහන් වෙයි. කුමරුන් තම තමන් නිතර දුටු බව පැහැදිළි ය. එසේ වන්නට නම් ඒ නගර එකිනෙක සමීපයෙහි පිහිටිය යුතු ය. ඒ නගර හා රාජධානි සිදුහත් කුමරුගේ උත්පත්තියට ටික කලකට පෙර, ලිච්ඡවි රජදරුවන්ගේ මෙන් ම එකම ජනසංඝයක් වන්නට ඇත. මගධ හා කොසොල් වැනි රාජ්‍ය ඒ කුඩා රාජ්‍යවලින් ද ඔබ්බට විකාශය වී විශාල රාජ්‍ය බවට පත්වී තිබෙන්නට ඇත.

මේ විකාශයෙහි ලිච්ඡවි රජදරුවන් ඒ වන විටත් ඉතිරි වී තිබීම බෞද්ධ සංස්කෘතියේ පදනමට බල පා ඇත. සංඝ සමාජය හා සාංඝික පුජාවත්, සංඝ සමාජයෙහි කතිකාවෙන් හා මහා සම්මතයෙන් (සමානඡන්දයෙන්) තීරණ ගැනීමත් පැහැදිළිව ම ලිච්ඡවි රජදරුවන්ගේ (එක් රජකු නොව රජවරු කිහිප දෙනකු) සංඝයෙන් ආභාසය ලබා ඇත. මෙහි දී තවත් වැදගත් කරුණක් වන්නේ ලිච්ඡවි රජදරුවන්ගේ ජනසංඝය නැති වී යන්නේ කවදාද යන්න එකල රජවරුන් හා වෙනත් අය අතර කතාබහට ලක් වී තිබීම ය. ඔවුන් ලිච්ඡවි රජදරුවන් නැති වී යන තුරු බලා සිටි බව පැහැදිළි ය.  බුදුන් වහන්සේගෙන් පවා ඒ පිළිබඳ කරුණු විමසීමට මහා රාජ්‍යවල රජවරු ඉදිරිපත් වී ඇත.

බුදුන් වහන්සේ සංඝ සමාජය පිහිටුවූයේ රාජ්‍යවල ජනසංඝය නැතිවෙමින් පැවති යුගයක ය. රාජ්‍යවල ජනසංඝය ඉක්මනින් ම නැතිවන බව බුදුන් වහන්සේ දැන සිටින්නට ඇත. උන්වහන්සේ භික්ෂු සමාජයට පමණක් සංඝයක්

© Prof. Nalin De Silva

නිර්දේශ කළහ. මගධ කෝසල වැනි රාජ්‍ය ශක්තිමත් වන අවධියක දී, ගිහි සමාජයෙහි සංඝයකට ඉඩක් නැති බව බුදුන් වහන්සේ තේරුම් ගන්නට ඇත.

ඉහත සඳහන් විස්තරය අපට අවශ්‍ය වන්නේ සංස්කෘතීන් ක්‍රියා කරන ආකාරය තේරුම් ගැනීමට ය. එකල සංස්කෘතියක් තවත් සංස්කෘතියකින් යමක් ලබාගත්තේ ඒ දෙය අවශ්‍ය නම් පමණකි. එහෙත් මේ කියමන එදා සමාජයට ගැලපුණ ද, අද සමාජයට වලංගු නො වෙයි. අද බටහිර සංස්කෘතික යටත්විජිතවාදයේ ආක්‍රමණය අප රටවල සිදුවන්නේ ඒ ආක්‍රමණයක් බව සම්පූර්ණයෙන් ම අවබෝධ නොවන ආකාරයකට ය. ආක්‍රමණයේ සත්භාවය පිළිබඳ විවිධ ප්‍රශ්න අද ඇති වී තිබේ. බටහිරයෝ තමන් ඉදිරිපත් කරන්නේ විශ්වයට ම අදාළවූවක් ය යන්න වක්‍ර ලෙස ප්‍රකාශ කරති.

මේ සියල්ල අප සාකච්ඡා කරමින් සිටින යක්ෂ ගෝත්‍රිකයන්ගේ තාක්ෂණය සමග බැඳී ඇත. යක්ෂ ගෝත්‍රිකයන්ට වැව් තැනීම පිළිබඳ දැක්මක් නො තිබුණි. එහෙත් ඔවුන්ට ඒ සඳහා අවශ්‍ය තාක්ෂණය තිබිණි. මෙරට එකල ජීවත් වූ ගෝත්‍රවල චින්තනය චක්‍රීය චින්තනයක් වූ බව නිසැක ය. දඹදිව ද ආර්යයන් පැමිණීමට පෙර තිබූ චින්තනය චක්‍රීය විය. එහෙත් ආර්යයන් පැමිණීමෙන් පසුව ඒක රේඛීය චින්තනය තහවුරු විය. ලෝකය (විශ්වය) එක් තැනකින් පටන්ගෙන දිගින් දිගට ගලා යන්නේ යැයි (එක්කෝ විනාශය කරා නැත්නම් උතුරුකුරු දිවයිනක් කරා) ඒක රේඛීය චින්තනයෙහි ලක්ෂණයක් වෙයි. ශිව, විෂ්ණු හා ඊශ්වර දෙවිවරුන් ගේ ත්‍රිමූර්තිය සහිත බ්‍රහ්මන් ඒක රේඛීය චින්තනයේ නිර්මාණය වූ සංකල්පයක් වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva